*සැ. යු.* - (i) 2014.01.17 වැනි දින පළවූ අංක 1846 දරන *ගැසට් පත්‍රයේ* I:III, II සහ V(A) කොටස් පළ නොවීය.
(ii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* V කොටස යටතේ 2011 වර්ෂයේ ජූලි සිට සැප්තැම්බර් දක්වා වූ කාර්තුවට අදාලව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,847 - 2014 ජනවාරි මස 24 වැනි සිකුරාදා - 2014.01.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 68 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 69 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 69 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 70 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 පෙබරවාරි මස 13 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 ජනවාරි මස 31 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

67– B 080805—300 (2014/01)

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2014 අංක 100

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම්

2010 අගෝස්තු මස 04 වැනි දින සිට පහත නම් සඳහන් අයවලුන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පයිලට් ඔෆිසර් වරුන් වශයෙන් අධිකාරියට පත් කිරීමටත් එදිනම සිටම ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් ඇති ශාඛාවන්ට ඇතුළත් කිරීමටත් අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රසාදය පළකොට ඇත :

පියාසර සැරයන් උඩුපිල මෙස්ත්‍රිගේ කරුණාරත්න (02838) - පරි/රෙජිමේන්තු ;
කෝප්‍රල් පත්තිනියා දුරගේ තුෂාන්ත (02839) - පරි/ රෙජිමේන්තු ;
සැරයන් ගාල්ලගේ සුනිල් (02840) - පරි/රෙජිමේන්තු ;
සැරයන් කරුණාරත්න වාසල මුදියන්සේලාගේ චමින්ද කුමාර කරුණාරත්න (02841) - පරි/රෙජිමේන්තු ;
සැරයන් වික්‍රම ආරච්චිගේ වීරකෝන් බණ්ඩා (02842) - පරි/ රෙජිමේන්තු ;
සැරයන් තුසිත සුරාජි හෙට්ටිගමගේ (02843) - පරි/ රෙජිමේන්තු ;
සැරයන් කන්කානමලාගේ උපුල් හේමසිරි (02844) - පරි/ රෙජිමේන්තු ;
සැරයන් විජේසිංහ මුදියන්සේලාගේ චමින්ද (02845) - පරි/ රෙජිමේන්තු ;
නායක ගුවන් භට බෙනරගම විදානෙලාගේ දොන් රුක්මන් ප්‍රේමලාල් (02846) - පරිපාලන ;
පියාසර සැරයන් ලුවිස් හේවාගේ රෝහිත සිරිලාල් (02847) - පරි/ රෙජිමේන්තු ;

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2011 පෙබරවාරි මස 28 වැනි දින,
කොළඹ දී ය.

01-647

---

2014 අංක 101

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම්

2008 ජූලි මස 19 වැනි දින සිට පහත නම් සඳහන් කැඩෙට් නිලධරින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පයිලට් ඔෆිසර්වරුන් වශයෙන් පත්කිරීමටත් එදිනම සිට ඔවුන්ගේ නම්වලට ඉදිරියෙන් ඇති ශාඛාවන්ට ඇතුළත් කිරීමටත් අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රසාදය පළකොට ඇත :

11504 කැඩෙට් නිලධාරි රත්මුතු ප්‍රනීත් සුරංග - උපකරණ (02848) ;
11494 කැඩෙට් නිලධාරි මාකවිටගේ ඩිහාන් රොමේෂ් පෙරේරා - නි. පො. රා. (02849) ;
11503 කැඩෙට් නිලධාරි හේනක රාළලාගේ විශ්වා මහේන්ද්‍රනාත් සේනානායක - උපකරණ (02850) ;
11449 කැඩෙට් නිලධාරි ගබඩාගේ දොන් දිනිදු ප්‍රවීන් සේනාරත්න - නි. පො. රා (02851) ;
11512 කැඩෙට් නිලධාරි රත්නෙත්තිගේ චානක නුවන් රත්නෙත්ති - පරි/රෙජිමේ (02852) ;
11514 කැඩෙට් නිලධාරි ගනෙහිඅච්චි කන්කානමලාගේ මනෝජ් ප්‍රියන්ත චන්ද්‍රලාල් - මෙහෙ/ගුවන් (02853) ;
11476 කැඩෙට් නිලධාරි හීන්කෙන්ද මුදියන්සේලාගේ ලකිඳු මිලින්ද බෝගහවත්ත - නි. පො. රා (02854) ;
11477 කැඩෙට් නිලධාරි රාවත්ත විදාන කන්කානම්ලාගේ සුපුන් බුද්ධික - උපකරණ (02855) ;
11498 කැඩෙට් නිලධාරි සුරාජ් තිළිණ සෝන්ඩර්ස් - නි. පො. රා (02856) ;
11487 කැඩෙට් නිලධාරි සමිත් උදාර කොඩිකාර - නි. පො. රා (02857) ;
11516 කැඩෙට් නිලධාරි අමිල නිරෝෂන් කරුණාරත්න - මෙහෙ/ගුවන් (02858) ;
11486 කැඩෙට් නිලධාරි අමරසිංහ ආරච්චිගේ රුවන් ලක්ෂාන් ජයතිස්ස - නි. පො. රා. (02859) ;
11507 කැඩෙට් නිලධාරි හෙට්ටි ආරච්චිගේ ප්‍රභාත් කාන්චන ප්‍රනාන්දු - පරි/රෙජිමේ (02860) ;
11510 කැඩෙට් නිලධාරි කුමාර ගමගේ දර්ශන මධුෂාන් - පරි/රෙජිමේ (02861) ;
11517 කැඩෙට් නිලධාරි රොබොල්ගේ ගන්ගන චන්ද්‍රෂාන් ලෙනෝරා - මෙහෙ/ගුවන් (02862) ;
11491 කැඩෙට් නිලධාරි බත්තන රාළලාගේ නුවන් සෙනරත් මුදියන්සෙ මැදගම - නි. පො. රා. (02863) ;
11500 කැඩෙට් නිලධාරි රණවීර රත්නතිලක පලිපාන වලව්වේ රුක්ෂාන් තිලකරත්න - නි. පො. රා. (02864) ;
11478 කැඩෙට් නිලධාරි වලිමුනිගේ චාතිම මධුරංග දයාරත්න - නි. පො. රා. (02865) ;
11509 කැඩෙට් නිලධාරි දිසානායක මුදියන්සේලාගේ ධනුෂ්ක චන්ද්‍රමාල් ජයරත්න - පරි/රෙජිමේ (02866) ;
11483 කැඩෙට් නිලධාරි පොල්වත්ත පතිරණගේ හිෂාන් එරන්ද ගුණවර්ධන - නි. පො. රා. (02867) ;
11488 කැඩෙට් නිලධාරි තරිඳු ධනන්ජය එදිරිසිංහ කොඩිතුවක්කු - නි. පො. රා. (02868) ;
11497 කැඩෙට් නිලධාරි විජේසිංහ විදානෙලාගේ දිනේෂ් රන්ගන පෙරේරා - නි. පො. රා. (02869) ;
11485 කැඩෙට් නිලධාරි හෙට්ටිආරච්චිගේ ශෂික මධුෂන්ක හෙට්ටිආරච්චි - උපකරණ (02870) ;
11482 කැඩෙට් නිලධාරි මහරගේ නිමේන්ද්‍ර රමේෂ් සිල්වෙස්ටර් ගුණවර්ධන - නි. පො. රා. (02871) ;
11481 කැඩෙට් නිලධාරි ගයිරාන ගමගේ සඳුන් අනුරාධ ගුණවර්ධන - නි. පො. රා. (02872) ;
11502 කැඩෙට් නිලධාරි වීරසිංහ මුදියන්සේලාගේ අමිල දිනේෂ් වීරසිංහ - නි. පො. රා. (02873) ;
11474 කැඩෙට් නිලධාරි හේවාරාලලාගේ ඉන්දික ප්‍රභාෂ් අමරදාස - උපකරණ (02874) ;
11496 කැඩෙට් නිලධාරි වර්ණකුල පටබැඳිගේ ඤුරාන් අමිල බුද්ධික බර්නාඩ් පෙරේරා - නි. පො. රා. (02875) ;
11501 කැඩෙට් නිලධාරි දේනෙත්ති නඳුන් උමයන්ග - නි. පො. රා. (02876) ;
11519 කැඩෙට් නිලධාරි නලින්ද සම්පත් සිරිමාන්න - මෙහෙ/ගුවන් (02877) ;

11493 කැඩෙට් නිලධාරි පුන්සර මධුසංක මුරගේ - උපකරණ (02878) ;

11492 කැඩෙට් නිලධාරි ශානක දුල්ෂාන් මැණික්ගේ - නි. පො. රා (02879) ;

11490 කැඩෙට් නිලධාරි මැණික්ආරච්චිගේ අර්ජුන උදාන්ත මැණික්ආරච්චි - නි. පො. රා. (02880) ;

11513 කැඩෙට් නිලධාරි ලියන රාලලාගේ තිලන්ක ප්‍රභාත් බණ්ඩාර සෙනෙවිරත්න - පරි/රෙජිමේ (02881) ;

11479 කැඩෙට් නිලධාරි රනුලු මාක් මිහිරාන් සාලින්ද පොන්සේකා - නි. පො. රා. (02882) ;

11489 කැඩෙට් නිලධාරි සඳුන් ප්‍රබෝධ මද්දුම ලියනගේ - නි. පො. රා. (02883) ;

11508 කැඩෙට් නිලධාරි පැට්‍රික් ක්ලිපර්ඩ් ජාන්ස් - පරි/රෙජිමේ (02884) ;

11511 කැඩෙට් නිලධාරි බොරලුගොඩගේ චමිල් තාරක පෙරේරා - පරි/රෙජිමේ (02885) ;

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2010 ඔක්තෝබර් මස 11 වැනි දින,
කොළඹ දී ය.

01-646

---

## අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2014 අංක 102

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) වැනි ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ :-

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I පන්තියේ ඊ. ඒ. සී. විදානගමාච්චි මහත්මිය 2013 සැප්තැම්බර් මස 16 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ වැඩබලන දිස්ත්‍රික් ලේකම්/දිසාපති වශයෙන්.

01-651/1

2014 අංක 103

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) වැනි ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ :-

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ ඩබ්ලිව්. ඩී. සෝමදාස මහතා, 2011 සැප්තැම්බර් මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු ආයතන අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

01-651/2

2014 අංක 104

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55(2) වැනි ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාර අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ :-

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ එස්. එස්. හෙට්ටිආරච්චි මහතා, 2013 අගෝස්තු මස 19 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්.

01-651/3

---

## රජයේ නිවේදන

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනත**

34(8)(අ) වගන්තිය යටතේ නියමය

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 34(8)(අ) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම මෙහි පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් "ඒන්ජල් පදනමේ ළමා නිවාසය" එකී වගන්තියෙහි කාර්ය සඳහා අනුමත පුණ්‍යායතනයක් ලෙස මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2013 දෙසැම්බර් මස 21 වැනි දින,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

**උපලේඛනය**

"ඒන්ජල් පදනමේ ළමා නිවාසය"

01-652

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**සෙලාන් බැංකුව පීඑල්සී - සංස්ථා සහ වෙරළබඩ බැංකු ව්‍යාපාර (පුද්ගලික බැංකු ව්‍යාපාර ඒකකය) ශාඛාව**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0860 - 330527 - 001(09957330527001) .

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013.11.07 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක : පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් එන්. ඩී. හිරිමුතුගොඩ විසින් දෙකම සහතික කරන ලද 2004 අගෝස්තු මස 25 දිනැති අංක 69 සහ 2007 නොවැම්බර් මස 29 දිනැති අංක 344, ප්‍රසිද්ධ නොතාරිස් එම්. ජී. ආර්. පී. කුමාරි විසින් දෙකම සහතික කරන ලද 2011 දෙසැම්බර් මස 16 දිනැති අංක 1385 සහ 2012 දෙසැම්බර් මස 5 දිනැති අංක 1541, ප්‍රසිද්ධ නොතාරිස් එන්. ඩී. හිරිමුතුගොඩ විසින් සහතික කරන ලද 2004 අගෝස්තු මස 25 දිනැති අංක 67, ප්‍රසිද්ධ නොතාරිස් එම්. ජී. ආර්. පී. කුමාරි විසින් දෙකම සහතික කරන ලද 2011 දෙසැම්බර් මස 16 දිනැති අංක 1386 සහ 2012 දෙසැම්බර් මස 5 දිනැති අංක 1521 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, කොළම 03 හි ශන්කර් වරධනාන්ද සෝමසුන්දරම් යන අය බන්ධනදායි වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් විසි අට කෝටි තිස්නවලක්ෂ විසි දහස් එකසිය පනස් දෙකයි ශත විසි එකක (රු. 283,920,152.21) මුදලක් 2013 ජුලි 1 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 283,920,152.21 මුදල ද, 2013 ජුලි 2 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් එක (31%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 69, 344, 1385, 1541, 67, 1386 සහ 1521 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කර ඇත්තාවූ මෙහි සඳහන් පළමු වැනි සහ දෙවැනි උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**පළමු උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සහ මහ නගර සභාව තුළ තිඹිරිගස්යාය වෝඩ් අංක 40 තුළ බම්බලපිටිය පිහිටි බලයලත් මිනින්දෝරු වී. සිතසබේසන් විසින් සාදන ලද 2000 මැයි මස 29 දිනැති අංක 1409 දරන සැලැස්මේ නිරූපනය වන හැව්ලොක් පාර වරිපනම් අංක 9 දරන ලොට් 1 ලකුණු කළ ගස්, වගා, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග, බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : හැව්ලොක් පාර වරිපනම් අංක 7 3/3 සහ 3/2 දරන පරිශ්‍රයන් ද, නැගෙනහිරට : රජයේ ඉඩම ද, දකුණට : හැව්ලොක් පාර වරිපනම් අංක 11 දරන පරිශ්‍රය සහ බස්නාහිරට : හැව්ලොක් පාර ද යන මායිම් තුළ එකී අංක 1409 දරන සැලැස්ම අනුව රූඩ් එකයි පර්චස් තිස් දෙකයි දශම දෙකයි පහක් (අ. 0 රූ. 1 පර්චස් 32.25) විශාල ඉඩම.

**දෙවැනි උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ මරදාන පංචිකාවත්ත පාර පිහිටි බලයලත් මිනින්දෝරු ටී. අයි. ඒ. ආනන්දප්පා විසින් සාදන ලද 1976 ඔක්තෝබර් මස 31 දිනැති අංක 750 දරන සැලැස්මේ සඳහන් වරිපනම් අංක 136 (පුවඩිස් රූ) දරන ලොට් 03 ලකුණු කළ ගොඩනැගිල්ල සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග, බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : දැන් වරිපනම් අංක 140 පරිශ්‍රය, වඩාත් නිවැරදිව පැසේජය ද, නැගෙනහිරට : දැන් වරිපනම් අංක 132/1 දරන පරිශ්‍රයද, දකුණට : එකී අංක 181 දරන සැලැස්මේ ලොට් 09 ද, (මාර්ගය), සහ බස්නාහිරට පංචිකාවත්ත පාර යන මායිම් තුළ එකී අංක 750 දරන සැලැස්ම අනුව පර්චස් පහළොවයි දශම අටයි හතක් (අ. 0 රූ. 0පර්. 15.87) විශාල, ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය /පත්ඉරුව ඒ 838/234 හි ලියාපදිංචි කර ඒ 838/291 ට ගෙන යන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කේ. හැච් මෙය,  
සහකාර සාමාන්‍යාධිකාරිනි - නීති.

01- 719/1

---

**මහජන බැංකුව - මහවැව ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.03.26 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මාරවිල ප්‍රසිද්ධ නොතාරිස් රුවිනි ඒ. එස්. දසනායක මහත්මිය විසින් සහතික කරන ලද 2005.09.01 දිනැති අංක 3109 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, රන්වලගේ නිහාල් ජෝශප් පිංතු යන අය විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් තුන්ලක්ෂ විසි එක්දහස් එකසිය අසූ එකයි ශත හැත්තෑ හයක (රු. 3,21,181.76) මුදලක් අයවීමට ඇති බැවින් ද, 2009.01.08 දින සිට වර්ෂයකට 16.75% බැගින් රුපියල් තුන්ලක්ෂ විසි එක්දහස් එකසිය අසූ එකයි ශත හැත්තෑ හයක (රු. 3,21,181.76) මුදල සඳහා පොළිය ද, වෙන්දේසි දිනය තෙක් තව දුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අය කරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් තුන්ලක්ෂ විසි එක්දහස් එකසිය අසූ එකයි ශත හැත්තෑ හයක (රු. 3,21,181.76) මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම විසින් එකී අංක 3109 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙනදේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත

යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**දේපළ පිළිබඳ විස්තරය**

1. වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරළේ, යටකලන්පත්තුවේ, මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොටසට අයත්, මට්ටාකොටුවැල්ල නමැති ගමේ පිහිටි කුප්පියවිල නමැති ඉඩමට ඒ. ඒ. විමලසේන බලයලත් මානකගේ 1993.11.01 දිනැති අංක 456 පිඹුර ප්‍රකාර ලොට් අංක 01 දරන කොටසට මායිම්, උතුරට : අංක 1594 දරන සිතියමේ ලොට් 05 දරන මෙම ඉඩමේ ඉතිරි කොටස ද, නැගෙනහිරට : අඩි 10ක් පළල පාර ද, දකුණට : අංක 1594 දරන සිතියමේ ලොට් 03 සහ 04 දරන කොටස් ද, බස්නාහිරට : අංක 1594 දරන සිතියමේ ලොට් 05 දරන මෙම මුළු ඉඩමේ ඉතිරි කොටස ද, යන මෙකී මායිම් තුළ වූ ප්‍රමාණයෙන් අක්කර බිංදුවයි, රූඩ් බිංදුවයි, පර්චස් විස්සක් (අ. 0, රූ. 0. පර්. 20) විශාල ඉඩමේ බිම සහ ඒ තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි යනා දී සෑම සියලු දේත් මේ සමග වේ.

මෙය මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කේ 79/92හි ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
පුත්තලම.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 79, මාරවිල පාර,
නාත්තන්ඩිය.

01-784

---

**නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013 නොවැම්බර් මස 29 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ලැප්සන් ට්‍රේඩ් සෙන්ටර්.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ජේ. ඒ. ඩබ්. කේ. හේරත් විසින් සහතික කරන ලද අංක 2165 සහ 2011 ඔක්තෝබර් මස 25 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය "ලැප්සන් ට්‍රේඩ් සෙන්ටර්" යන නාමය, විලාසය සහ අභිධානය යටතේ තනි හිමිකාර ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන, මෙහි බන්ධනදායී සහ උකස් බැඳුම්කරු වශයෙන් මොහොමඩ් ලෆීර් මොහොමඩ් සෙයාද් යන අය විසින් ලබා ගන්නා ලද මුල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී මොහොමඩ් ලෆීර් මොහොමඩ් සෙයාද් යන අය විසින් කොළඹ 02 යුනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පීඑල්සී නමට උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද, ඉහත සඳහන් ණය ගැණුම්කරු ඉහත කී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලද බැවින් ද,

රුපියල් අසූහතරලක්ෂ හැත්තෑ තුන්දහස් පන්සිය අසූතුනයි ශත අසූතුනක (රු. 84,73,583.83) මුදල සහ 2013 සැප්තැම්බර් මස 10 වැනි දිනට අයිරා පහසුකම් මත හිඟ මුදල වන රුපියල් අටලක්ෂ අසූදහස් එකසිය අනූ තුනයි ශත හතක (රු. 8,80,193.07) මුදල මත (වැල් පොලී සහ මාසික විරාම පදනමින්) සහ 2013 සැප්තැම්බර් මස 10 වැනි දිනට 1 වන සහ 11 වන වාර ණය පහසුකම් මත හිඟ මුල වන රුපියල් හැත්තෑඑක්ලක්ෂ හැත්තෑපන්දහස් නවසිය හතළිස් නවයයි ශත අනූහයක (රු. 71,75,949.96) මුදල මත 2013 සැප්තැම්බර් මස 11 වැනි දින සිට තවදුරටත් පොළිය ද, සම්බන්ධිත ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් යම් ගාස්තු ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවා ඇති යම් මුදලක් (වෙතොත්) එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය කොළඹ ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් හි ත්‍රිවංක සී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**ඉහතකී උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළයේ මැදපත්තුවේ තිහාරියේ පිහිටි දෙල්ගහවත්ත, ඇටඹගහවත්ත, නුගගහලන්ද සහ ඇටඹගහලන්ද නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. රූපසිංහ විසින් මැන සාදන ලද අංක 128/2011 සහ 2011 ජූලි මස 17 වැනි දින දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 9 ඒ දරන බෙදා වෙන් කළ බිම් කොටසට මායම් ඊසානට ෆාතිමා ෂයිකා, එම්. නව්සාඩ් සහ එම් හනීෆා සහ මුස්ලිම් පල්ලිය හිමිකම් කියන, අංක 2313 දරන පිඹුරේ නිරූපිත අංක 8 දරන කැබලි ද, ගිණිකොනට එම්. එල්. එම්. සෙයාද් විසින් හිමිකම කියන කැබලි අංක 9 බී හි ඉතිරි කොටස ද, නිරිතට නිවෙස්වල සිට කොළඹ-මහනුවර පාර දක්වා වැටී ඇති අඩි පහළොවක් පළල ප්‍රවේශ මාර්ගය ද, වයඹට එම්. එල්. එම්. බකීර් යන අය හිමිකම් කියන, අංක 2386 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 7 ද, යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් දහයක් (අ. 0, රූ. 01, පර්. 10) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ, පළතුරු ආදී සෑම සියලු දේත් සමග ය.

ඉහත කී කැබලි අංක 9 ඒ දරන ඉඩම පහත සඳහන් විස්තර කරන ඉඩමේ කොටසක් වේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, මැදපත්තුවේ, තිහාරියේ පිහිටි දෙල්ගහවත්ත, ඇටඹගහවත්ත, නුගගහලන්ද සහ ඇටඹගහලන්ද නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එෆ්. සමීර් විසින් මැන සාදන ලද අංක 2386 සහ 1980 ඔක්තෝබර් මස 05 වැනි දින දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 09 දරන බෙදා වෙන් කළ බිම් කොටසට මායිම් ඊසානට අංක 2313 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක බී 2 ද, ගිණිකොනට කැබලි අංක 10 ද, නිරිතට කැබලි අංක 8 (පාර සඳහා වෙන් කිරීම) ද, වයඹට කැබලි අංක 7 ද, යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 2386 දරන පිඹුර අනුව අක්කර එකක් (අ. 01, රූ. 0, පර්. 0) විශාල ඉඩම ය.

මෙම දේපළ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය ඊ 1020/246 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

01-720/1

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013 නොවැම්බර් මස 29 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දුමින්ද කංකානම්ගේ, බිබුලවත්ත, උඩුකාව, දෙනිපිටිය.

මාතර ප්‍රසිද්ධ නොතාරිස් සරත් ප්‍රිය සෙනරත් විසින් සහතික කරන ලද අංක 6591 සහ 2011 දෙසැම්බර් මස 28 වැනි දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය මෙහි බන්ධනදායී සහ උකස් බැඳුම්කරු වශයෙන් දුමින්ද කංකානම්ගේ යන අය විසින් ලබා ගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් ඔහු විසින් කොළඹ 02, යූනියන් පෙදෙසේ, අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී නමට උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද, ඉහත සඳහන් ණය ගැණුම්කරු වන දුමින්ද කංකානම්ගේ යන අය ඉහත කී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලද බැවින් ද,

රුපියල් හැත්තෑලක්ෂ දසදහස් පන්සිය තිස් අටකුත් ශත හැත්තෑඅටක (රු. 70,10,538.78) මුදල සහ 2013 සැප්තැම්බර් මස 09 වැනි දිනට I වන සහ II වන වාර ණය මත හිඟ මුදල වන රුපියල් පනස්නවලක්ෂ පනස්හත්දහස් පන්සිය හතළිහකුත් ශත විසිහතරක (රු. 59,57,540.24) මුදල මත 2013 සැප්තැම්බර් මස 10 වැනි දින සිට තවදුරටත් පොළිය ද, සම්බන්ධිත ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් යම් ගාස්තු ප්‍රමාණයන්ද, තදනන්තරව ගෙවා ඇති යම් මුදලක් (වෙතොත්) එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය කොළඹ ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් හි ත්‍රිවංක සී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### ඉහත කී උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම කෝරළයේ, උඩුකාවේ පිහිටි පාළුරාදාගේවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සී. එස්. ජයවර්ධන විසින් මැන සාදන ලද අංක 9639 සහ 2004 ජූලි මස 29 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක ඒ දරන බිම් කොටසට මායිම් ඊසානට සහ නැගෙනහිරට : ප්‍රාදේශීය සභා පාර තෙක් වැටී ඇති පාර ද, ගිණිකොණට : ඇල ද, නිරිතට : ඉහළ බිබුල ද, වයඹට : ගමගෙයි බිබුල ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 9639 දරන පිඹුර අනුව රූඩ් එකයි, පර්චස් දහයයි දශම නවයයි දෙකක් (අ. 0, රූ. 1, පර්. 10.92) හෙවත් හෙක්ටයාර් 0.1288ක් විශාල සමස්ත ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ, පළතුරු, පස ආදී සෑම සියලු දේත් සමග ය. මෙම දේපළ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ D1162/26 යටතේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු කේ. ජී. එස්. යාපා විසින් මැන සාදන ලද මාතර දිසා අධිකරණයේ අංක L6975 දරන නඩුවට ගොණු කර ඇති අංක 114ජී සහ 1991 දෙසැම්බර් මස 13 දින දරන පිඹුරේ කැබලි අංක A, B, C, E සහ D වශයෙන් නිරූපිත, ඉහත කී අංක 9639 දරන පිඹුරේ පෙන්නුම් කරන පාරේ මාර්ග අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

01-720/2

---

## සෙලාන් බැංකුව පීඑල්සී - ගාල්ල ශාඛාව

(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013 ඔක්තෝබර් මස 23 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0160-02406211-001.
පාරිභෝගිකයාගේ නම : අමරසිරි මහින්ද ජයවර්ධන.

2010 දෙසැම්බර් මස 1 දින සම්මත කර ගන්නා ලද අංක 779/2010(XVII) යෝජනාව මගින් සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය දෙකම ප්‍රසිද්ධ නොතාරිස් යූ. ජේ. එන්. ජයලත් විසින් සහතික කරන ලද 2008 අප්‍රේල් මස 25 දිනැති අංක 1634 සහ 2008 ජූනි මස 18 දිනැති අංක 1689 දරන උකස් බැඳුම්කරය මත ඉමදූව පදිංචි අමරසිරි මහින්ද ජයවර්ධන යන අය විසින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තා වූ එකී උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද සහ/හෝ මෙහි සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර කේ. පී. එන්. සිල්වා මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව අනුමත කරන ලදී.

කේ පී. එන්. සිල්වා මහතා වෙනුවට බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා පත් කිරීමට දැන් තීරණය කර ඇත.

මෙහි සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කරනු ලබන එකී දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියක් මගින් විකිණිය යුතු බවට සම්මත කරන ලදී.

### ඉහතකී උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තලපේ පත්තුවේ, අන්ගුලුගහ පිහිටි බලයලත් මිනින්දෝරු කේ. ජී. සමරසේකර විසින් සාදන ලද 2006 දෙසැම්බර් මස 20 දිනැති අංක 1149 දරන සැලැස්මේ නිරූපනය වන අත්තලහේන නමැති ඉඩමේ යාව ඇති ලොට් බී සහ එහි හි බෙදා වෙන් කරන ලද ලොට් 5ට මායිම්, වයඹට : මෙම ඉඩමේ ලොට් 2 ද, උතුරට : ලොට් 2 සහ පාරක් ලෙස ලකුණු කළ ලොට් 4 ද, නැගෙනහිරට : මෙම ඉඩමේ ලොට් ඊ ද, දකුණට : අත්තලහේන කුඹුර ද, බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් ජී ද යන මායිම් තුළ පර්චස් විස්සක් (අ. 0, රූ. 0, පර්. 20) නොහොත් හෙක්ටෙයාර් 0.0506ක් විශාල ගොඩනැගිල්ල, වගා සහ සියලු හිමිකම්, පරවශතා සහ ලොට් 3 සහ 4 උඩින් මාර්ග අයිතිය සමග ඉඩම. මෙය ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව ඩී937/172හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

කේ. හැව් මිය,
සහකාර සාමාන්‍යාධිකාරී-නීති.

01-719/2

---

### මහජන බැංකුව - අවිස්සාවේල්ල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013 ජුනි මස 28 වැනි දින පැවැත් වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මහජන බැංකුවේ නමට කොළඹ නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් ඩී. කේ. කේ. වැලිකුඹුර මහත්මිය විසින් සහතික කරන ලද 2006.12.06 වැනි දින අංක 1441 සහ 2007.03.07 වැනි දින අංක 1616 දරන උකස්කරයන් ප්‍රකාර ගෙවීම්, මහදුරගේ චන්ද්‍රදාස මහතා සහ මල්දෙණිය කංකානමලාගේ දයා මංගලිකා මිය යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී බැඳුම්කරය මත රුපියල් තුන්ලක්ෂ පනස් දහසක් සහ ශත දහනවයක් (රු. 3,50,000.19) හා රුපියල් විසිහත් ලක්ෂ දහතුන් දහස් හත්සිය දහයයි ශත තිහක (රු. 27,13,710.30) මුදල මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2010.02.16 දින සිට වර්ෂයකට 22% බැගින් තුන්ලක්ෂ පනස් දහසක් සහ ශත දහනවයක (රු. 3,50,000.19) මුදලකට ද, 2010.06.07 දින සිට වර්ෂයකට 22% බැගින් රුපියල් විසිහත් ලක්ෂ දහතුන් දහස් හත්සිය දහයයි ශත තිහක (රු. 27,13,710.30) මුදල් සඳහා වෙන්දේසි දිනය තෙක් තව දුරටත් පොලිය සහ අදාළ මහජන බැංකු පනතේ 29ඕ වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් හා ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් තුන්ලක්ෂ පනස් දහසක් සහ ශත දහනවයක (රු. 3,50,000.19) මුදල හා රුපියල් විසිහත් ලක්ෂ දහතුන් දහස් හත්සිය දහයයි ශත තිහක (රු. 27,13,710.30) මුදල ද අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මහතා විසින් එකී අංක 1441 හා 1616 දරන උකස් බැඳුම්කරයන් යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු බවට, 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තරය

උකස්කර අංක 1441 දරන දේපළ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, උඩුගහ පත්තුවේ, සීතාවකපුර නගර සභා සීමාව තුළ උක්වත්ත ග්‍රාමයේ පිහිටි "හොනිටන් වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. බී. පී. ජයලත් කුමාර මහතා විසින් මැන සාදන ලද අංක 103 දරන පිඹුරේ ලොට් 01 සඳහා මායිම්, උතුරට : කැබලි අංක 141 ද, නැගෙනහිරට : කැබලි අංක 59 ද, දකුණට : කැබලි අංක 143 ද, බස්නාහිරට : මාර්ගය ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් තිහයි දශම පහ (අ. 0, රූ. 0, පර්. 30.5) ක් විශාල ඉඩම වේ.

ඉහත සඳහන් ඉඩම පහත සඳහන් ඉඩම නැවත මැන සාදන ලද්දකි.

ඉහත කී උක්තවත්ත ගමේ පිහිටි "හොනිටන් වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එන්. එස්. එල්. ප්‍රනාන්දු මහතා විසින් මැන සාදන ලද 1965 ජුනි මස 05 වැනි දිනැති අංක 516 දරන පිඹුරේ ලොට් අංක 142 සඳහා මායිම්, උතුරට : 516 පිඹුරේ ලොට් 141 ද, නැගෙනහිරට : 516 පිඹුරේ ලොට් 59 ද, දකුණට : 516 පිඹුරේ ලොට් 143 ද, බස්නාහිරට : පාර ද යන මෙකී මායිම් තුළ පිහිටි පර්චස් තිස් එකයි දශම බිංදුවයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 31.02) විශාල ඉඩම වේ.

මෙය අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පී 170/203 යටතේ ලියාපදිංචි කර ඇත.

උකස්කර අංක 1616 දරන දේපළ විස්තරය :

01. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, නැගෙනහිර හේවාගම් කෝරළේ, උඩුගහපත්තුවේ සීතාවක නගර සභා සීමාව තුළ පුවක්පිටිය ග්‍රාමයේ පිහිටි "ටෝකේ වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. පී. ජයලත් කුමාර මිනින්දෝරු මහතා විසින් 2006.08.07 වැනි දින මැන සාදන ලද අංක 2555 දරන පිඹුරේ ලොට් අංක 01 සඳහා මායිම්, උතුරට සහ නැගෙනහිරට : ලෙව්වම් අම්මාට අයිතිව තිබූ ටෝකිගේ වත්තේ කොටසක් ද, දකුණට : ආර්. ඒ. බේබි නෝනාට අයිතිව තිබූ ඉඩම ද. බස්නාහිරට : කොළඹ අවිස්සාවේල්ල ප්‍රධාන මාර්ගය ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි, පර්චස් දෙකයි දශම හතයි බිංදුව (අ. 0, රූ. 1, පර්. 2.70) ක් විශාල ඉඩම වේ.

මෙය අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පී 167/208 යටතේ ලියාපදිංචි වි ඇත.

02. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, නැගෙනහිර හේවාගම් කෝරළයේ, උඩුගහපත්තුවේ සීතාවක නගර සභා සීමාව තුළ උක්වත්ත ග්‍රාමයේ පිහිටි "හොනිටන් වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. පී. දැරණියගල මහතා විසින් 2005.12.04 දින මැන සාදන ලද අංක 2005/230 දරන පිඹුරේ ලොට් ඒ සඳහා මායිම්, උතුරට : අංක 1006 දරන පිඹුරේ අංක 08 දරන කැබැල්ල ද, නැගෙනහිරට : මනමේන්ද්‍ර මාවත ද අංක 1006 දරන පිඹුරේ අංක 34 ද, දකුණට : අංක 1006 දරන පිඹුරේ ලොට් අංක 11 සහ 36 ද, බස්නාහිරට : කිරිවන්දල ඇල ද යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි, පර්චස් විසි නවයයි දශම පහ (අ. 0, රූ. 2, පර්. 29.5) ක් විශාල ඉඩම වේ.

මෙය අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පී 131/273 යටතේ ලියාපදිංචි වී ඇත.

ඉහත සඳහන් ඉඩම පහත සඳහන් ඉඩම් ඒකාබද්ධ කර සාදා ඇත.

01. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ හේවාගම් කෝරළයේ උඩුගහපත්තුවේ අවිස්සාවේල්ල නගර සභා සීමාව තුළ අවිස්සාවේල්ල නගර සභා අංක 08 දරන කොට්ඨාසයේ අවිස්සාවේල්ල කොළඹ පාරේ පිහිටා තිබෙන බලයලත් මානක ඇස්. ආර්. යාපා මහතා විසින් 1958.11.18 වැනි දින මැන සකස් කරන ලද අංක 1006 දරන පිඹුර මගින් බෙදා වෙන් කරන ලද "හොනිටන් එස්ටේට්" නමැති ඉඩමේ බෙදා වෙන් කරන ලද අංක 09 දරන බිම් කැබැල්ලට එකී පිඹුරේ ප්‍රාකර මායිම්, උතුරට : ලොට් 08 ද, නැගෙනහිරට : පාර ද, දකුණට : ලොට් 10 ද බස්නාහිරට : ඇල ද යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් එකයි, පර්චස් දහතුනයි දශම පහ (අ. 0, රූ. 1, පර්. 13.5) ක් විශාල ඉඩම වේ.

මෙය අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පී 131/46 යටතේ ලියාපදිංචි වී ඇත.

02. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ හේවාගම් කෝරළයේ, උඩුගහපත්තුවේ, අවිස්සාවේල්ල නගර සභා සීමාව තුළ අවිස්සාවේල්ල නගර සභා අංක 08 දරන කොට්ඨාසයේ අවිස්සාවේල්ල කොළඹ පාරේ, පිහිටා තිබෙන බලයලත් මානක ඇස්. ආර්. යාපා මහතා විසින් 1958 නොවැම්බර් මස 18 වැනි දින මැන සකස් කරන ලද අංක 1006 දරන පිඹුර මගින් බෙදා වෙන් කරන ලද "හොනිටන් එස්ටේට්" නමැති ඉඩමේ බෙදා වෙන් කරන ලද අංක 10 දරන බිම් කැබැල්ලට එකී පිඹුරේ ප්‍රකාර මායිම්, උතුරට : මෙම ඉඩමේ අංක 09 දරන කැබැල්ල ද, නැගෙනහිරට : පාර ද, දකුණට : මෙම ඉඩමේ අංක 11 දරන කැබැල්ල ද , බස්නාහිරට : ඇල ද යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් එකයි, පර්චස් දහසය (අ. 0, රූ. 1, පර්. 16)ක් විශාලකම ඇති වරිපනම් අංක 216/6 දරන ඉඩම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු ආදී සියළු දේ ද වේ.

මෙය අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පී 131/147 යටතේ ලියාපදිංචි කර ඇත.

මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
(කොළඹ පිටත).

ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
කොළඹ පිටත,
මහජන බැංකුව,
අංක 177ඒ, හයිලෙවල් පාර,
නුගේගොඩ.

01-783

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.